# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2356/07 – 2023 ඔක්තෝබර් මස 30 වැනි සඳුදා – 2023.10.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2020/47

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. එච්. ඩී. මල්කාන්ති මිය, අංක 376-15 ඩී 06, එරමිණියාය, අඟුණකොලපැලැස්ස.
2. ඩබ්. ටී. කේ. රේණුකා මිය, ''තක්සලා'', හොරවල, වැලිපැන්න.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත


1A – G 040636 – 21 (2023/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගාල්ල, අනගාරික ධර්මපාල මාවත, අංක 32/26 එල්, එම්. එම්. අයි. ආර්. ඒ. ජයතිලක මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2020/47

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. එච්. ඩී. මල්කාන්ති මිය, අංක 376-15 ඩී 06, එරමිණියාය, අඟුණකොලපැලැස්ස.
2. ඩබ්. ටී. කේ. රේණුකා මිය, ''තක්සලා'', හොරවල, වැලිපැන්න.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''එච්. ඩී. මල්කාන්ති මිය හා ඩබ්. ටී. කේ. රේණුකා මිය යන සේවිකාවන් දෙදෙනා හට 2001.11.15 දිනට ලිපිකරු III ශ්‍රේණියේ පත්වීම් හිමි ද යන්නත් හිමි නම් එය ලබා නොදීම හා ඩබ්. ටී. කේ. රේණුකා මිය හට ලිපිකරු III ශ්‍රේණියේ පත්වීම හිමි නම් එය ලබා නොදී කම්කරු පත්වීම් ලබා දීම තුළින් අසාධාරණයක් සිදුවී තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 10 - 0300

මගේ අංකය: IR/COM/01/2021/165

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**
4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

මල්ලිකා පී. උක්වත්තගේ මහත්මිය, අංක 20, වල්පිටමුල්ල, දෙවලපොල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

මාර්ග සංවර්ධන අධිකාරිය, ''මගනැගුම මහ මැදුර'', ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතලේ, හිඟ්ගොල්ල පාර, පළමු පටුමග, අංක 34/64, ඒ. බී. හේරත් මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2021/165

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

මල්ලිකා පී. උක්වත්තගේ මහත්මිය, අංක 20, වල්පිටමුල්ල, දෙවලපොල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

මාර්ග සංවර්ධන අධිකාරිය, ''මගනැගුම මහ මැදුර'', ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''මාර්ග සංවර්ධන අධිකාරියේ සේවය කළ මල්ලිකා පී. උක්වත්තගේ මහත්මිය හට පහත කරුණු මගින් අසාධාරණයක් සිදුවී තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් හිමිවිය යුතු සහන කවරේ ද? කවරදා සිට ද යන්නත් පිළිබඳව වේ.'

1. අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන) තනතුර හිමි ද හිමි නම් එය ලබා නොදීම.
2. 2019.08.31 දිනයට 1 ශ්‍රේණිය හිමි ද හිමි නම් ලබා නොදීම.
3. 2009.08.19 සිට ආයතනයේ ප්‍රතිව්‍යුහගත කිරීමට අනුව වැටුප් විෂමතාවය ඉවත්කිරීමට අනෙකුත් සේවකයින්ට ලබා දුන් වැටුප් වර්ධක 04ක් හිමි ද හිමි නම් එය ලබා නොදීම.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ඔක්තෝබර් මස 10 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 10 - 0301

---

මගේ අංකය: IR/COM/01/2022/69

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**
4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්. පී. අයි. එච්. රාජපක්ෂ මිය, අංක 289/8, වැව පාර, මාලඹේ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය, එම්. ඩී. එච්. ජයවර්ධන මාවත, අතුරුගිරිය.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මහනුවර, අනගාරික ධර්මපාල මාවත, අංක 129/8 බී, ''ජනහිරු'', නීතිඥ ආචාර්ය කාංචන සිල්වා මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2022/69

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්. පී. අයි. එච්. රාජපක්ෂ මිය, අංක 289/8, වැව පාර, මාලඹේ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය, එම්. ඩී. එච්. ජයවර්ධන මාවත, අතුරුගිරිය.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ සහකාර අධ්‍යක්ෂ (පාලන) ලෙස සේවය කළ ආර්. පී. අයි. එච්. රාජපක්ෂ මහත්මිය 2019.03.25 දින සිට බලපැවැත්වෙන පරිදි රැකියාවෙන් ඉවත් කිරීමේ දී ආයතනය අනුගමනය කර ඇති ක්‍රියාපිළිවෙල මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 10 - 0302

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.